# "අපි වවමු - රට නගමු"
# සහ හම්බන්තොට කෘෂි ප්‍රබෝධය

පෙරදිග ලෝකයේ මුතු ඇටය ලෙස නම් ලද ශ්‍රී ලංකාව, සහල් ධාන්‍යාගාරය ලෙස ද නමක් ඉසිලීය. විසිරී - පැතිර ගිය විවිධ දේශගුණික කලාපයන්ගෙන් සමන්විත මෙරට ප්‍රධාන ජීවනෝපාය වන්නේ ද කෘෂිකර්මාන්තයයි.

මෙරට කෘෂි - පාරිසරික කලාප දෙස විමසා බලන විට $DL_1$ සිට $DL_5$ දක්වා වූ විශාල ප්‍රදේශයක පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය තුල විවිධ දේශගුණික පරාසයන් දැකිය හැකිය. මාතර, රත්නපුර, මොණරාගල යන දිස්ත්‍රික්ක වලට මායිම්ව පිහිටා ඇති මෙම දිස්ත්‍රික්කය යාල, බුන්දල, වනෝද්‍යාන වලින් ද, රමණීය වූ ඉන්දියන් සාගරයෙන් ද වට වී පවතී. සමනළ කඳු මුදුනෙන් ආරම්භ වන ප්‍රධාන ගංගා අතුරෙන් වළවේ ගඟ මුහුදට ගලා බසින්නේ අම්බලන්තොට නගරය මැදින් ගලාගොස් වළවේ ගං මෝය කට ඔස්සේය. ලුණුගම්වෙහෙර කිරම ඔය, මීරිදියගම, ඌරු බොකු ඔය, කිරිදි ඔය වැනි විශාල වාරි යෝජනා ක්‍රම තුලින් මෙම දිස්ත්‍රික්කයේ සශ්‍රීක පොළොවේ සාරය සමග එක්ව, ප්‍රදේශයේ ගොවි ජනතාවගේ ජීවන බර අඩු කිරීමට සොබා දහම සමග එක්වීමක් දැකිය හැකිය. එනම් සාරවත් භූමිය සහ එහි වැවෙන විවිධ වූ බෝගයන්ය.

මෙවන් සුන්දර ප්‍රදේශයක් වන හම්බන්තොට දිස්ත්‍රික්කය සමස්ථයක් ලෙස ජාතික කෘෂි නිෂ්පාදනයට විශාල දායකත්වයක් සපයයි. එය දෙගුණ - තෙගුණ කිරීමට කඩිම වැඩසටහනක් ක්‍රියාවට නැංවී තිබේ. ඒ අනෙකක් නොව "අපි වවමු - රට නගමු" වැඩ සටහනයි. ප්‍රදේශයේ ගොවි ජන සේවා මධ්‍යස්ථාන 16 ක් යටතේ ග්‍රාම නිළධාරී වසම් 577 ක් සම්බන්ධ කොට කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර (කෘ.ප.නි.ස.) නිළධාරීන් 448 දෙදෙනෙකු විසින් දැනටමත් මෙම මෙහෙයුම ක්‍රියාවට නංවා හමාරය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සෑම කෘ.ප.නි.ස වරයෙකු විසින්ම ගෙවතු 05 ක් සහ කොම්පෝස්ට් කොරටු 05 ක් ස්වකීය බල ප්‍රදේශය තුල ආරම්භ කොට, ඉදිරියට පවත්වාගෙන යාමේ වගකීමෙන් බැඳී සිටී. මෙහි දී ඔවුන් දිරිගැන්වීමක් ලෙස 05 කට වඩා වැඩිවන සෑම ගෙවත්තක් වෙනුවෙන්ම කෘ.ප.නි.ස. කාර්ය සාධන ඇගයුම් වල දී එක ලකුණ බැගින් ලබාදීමට කටයුතු යොදා ඇත. තවත් වැදගත් කරුණක් වන්නේ සෑම ගොවිජන සේවා මධ්‍යස්ථානයකම දැකුම්කළු ගෙවත්තක් සහිත පරිසරයක් නිර්මාණය වෙමින් පැවතීමයි. දැනට ප්‍රදේශයේ ගෙවතු අතර පැවැත්වෙන ගෙවතු වගා තරග හේතුවෙන් ගොවීහු මහත් උනන්දුවකින් වගා කටයුතු වල නියැලී සිටිති.

මෙම ගෙවතු වගා වැඩසටහන නිසා හම්බන්තොට දිස්ත්‍රික්කයේ අලුතෙන් වගාවට එක්වන ගෙවතු සංඛ්‍යාව අවම වශයෙන් 2,240 කි. කෙසේ වෙතත්, ගොවිජන සේවා මධ්‍යස්ථානයන් මගින් මෙම සංඛ්‍යාව 4,480 දක්වා ඉහළ නැංවීමට කටයුතු කරමින් සිටී. මෙමගින් දිස්ත්‍රික්කයේ ගොවීන් 4,480 කගේ ගෘහ ආර්ථිකය සවිමත් වීම මෙන්ම රටේ සමස්ථ ජාතික කෘෂි නිෂ්පාදනය ද නොඅනුමානවම වර්ධනය වනු ඇත.

"අපි වවමු - රට නගමු" වැඩ සටහන මගින් වල් බිහිව තිබූ භූමිය යළි වගාවට යොමු කිරීමත්, එමගින් නිල්ල පිරුණු දේශයකට රට ගෙන යාමට හැකිවීමත් එකී දසුන නැරඹීමෙන් මනස තුල ඇතිවන ප්‍රබෝධයත් මිල කළ නොහැකි වනු ඇත.

මෙහි දී අවධානයට ලක්විය යුතු අංශ අතර වැට කොරටු ක්‍රමයට තැනූ කොම්පෝස්ට් පොහොර යෙදීමෙන් වගා කෙරෙන බෝග වස විසෙන් තොර පෝෂණයෙන් ඉහළ මට්ටමක පවතී. උපරිම අස්වැන්නක් ද සහිත අතර නිසරු පස දී සාරවත් කරන්නකි. එමෙන්ම, රසායනික පොහොර සහ වෙනත් යෙදවුම් සඳහා වැයවන මුදල් ඉතිරි කරගත හැකිය.

යළි පිබිදෙන දේශය දෙස නෙත් යොමන විට මෙම වැඩ සටහන ආරම්භ කළ යුතුව තිබුණේ මෙයට වසර ගණනාවකට පෙරාතුව බව හැඟී යයි. ප්‍රමාද වී හෝ අපි දැන් රට වෙනුවෙන් මහත් වූ කාර්යයකට පා තබා ඇත්තෙමු. එමෙන්ම, දේශීය වශයෙන් මෙරට ක්‍රියාත්මක වූ සෙසු ව්‍යාපෘති දෙස බලන විට පෙනී යන කරුණක් වන්නේ "අපි වවමු - රට නගමු" වැඩ සටහන සම්පූර්ණයෙන්ම ප්‍රායෝගික එපමණටම මහජන සහභාගිත්වය ද සහිත වැඩ සටහනක් බවයි. එකී වැඩ සටහනෙහි සාර්ථකත්වය යනු අනාගත ස්වයං පෝෂිත දේශයකට තබන මුල් පියවරකි.

**එල්.එම්.පී.ඩී. තිලාන් ජානක**
*කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර*
ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය
හම්බන්තොට